# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

40 වන කාණ්ඩය | 06 වන කලාපය | 2024 ජූලි කලාපය


# රොෂේන් ශානක කම්කරුවන් වෙනුවෙන් දිවි දී වසර දහතුනක්



**නිදහස්** වෙළඳ කලාප සේවකයින් තම සේවක අර්ථසාධක අරමුදල සුරක්ෂිත කර ගැනීමේ අරගලය දියත් කර වසර දහතුනක් ගත වී ඇත. මීට වසර දහතුනකට පෙර කටුනායක නිදහස වෙළඳ කලාප වැඩ බිම අරගල භූමියක් බවට පත් වුයේ එවක ජනපති මහින්ද රාජපක්ෂගේ නායකත්වයෙන් යුත් රජය විසින් සේවක අර්ථසාධක අරමුදල කප්පාදු කර, විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඉදිරිපත් කිරීමට ගෙන එන ලද යෝජනාවට එරෙහිවය. එම යෝජනාව "අර්ථසාධක අරමුදල කොල්ලකෑමට ගන්නා උත්සාහයක්" ලෙස චෝදනා කරමින් දින කිහිපයක් තිස්සේ රට පුරා කම්කරුවන් විරෝධය දැක්වූ අතර පැවති විරෝධයන්ට රජය පාර්ශවයෙන් පිළිගත හැකි විසඳුමක් නොලැබීම හේතුවෙන් 2011 මැයි මස 24 වැනිදා රජයට එරෙහි විරෝධය තීව්‍ර කරමින් කටුනායක නිදහස් වෙළඳ කලාප සේවකයන් වැඩ වරමින් වීදි සටනක් ආරම්භ කළහ. එයින් නොනැවතුන වර්ජනය මැයි 30 වනදා දක්වා ගෙන යාමට කම්කරුවන්ට සිදු වුයේ අදාල බලධාරීන් විසින් සිය ඉල්ලීම් වලට සාධාරණ විසඳුමක් නොදුන් නිසාය.

නිරායුධ කම්කරුවන්ගේ එම විරෝධතාවට පොලිසිය විසින් වෙඩි තැබූ අතර කම්කරුවන් 400කට පමණ එහිදී තුවාල සිදු විය, තවත් 3,000 කට ආසන්න පිරිසක් ශාරීරික හා මානසික ආතතිය සම්බන්ධ ගැටළු වලට මුහුණ දුන්හ. කම්කරුවෙකු වන රොෂේන් ශානක ජූනි 01 වන දින

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 පිටුව - කාන්තා ශ්‍රමය තව තවත් සූරාකෑමට සලස්වන ආර්ථික පරිවර්තන පනත

04 පිටුව - කළු ජූලියේ අඳුරු මතක

5 - 08 පිටුව - අපේ වැඩ

09 පිටුව - විදෙස් පුවත් / කවි පිටුව

10 පිටුව - සිතුවිල්ල / ප්‍රහේලිකාව

11 පිටුව - ධාබිඳු සාමූහික සංගමය

**ඩාබිඳු සාමුහිකය**

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# නාස්තිකාර වියදම් වෙනුවෙන් මහජනතාවට බදු

විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ මුවාවෙන් බලයට පැමිණි ජනාධිපතිවරු මෙරට බංකොලොත් භාවයට පත් කිරීමට අවැසි සියලු දේ කර හමාරය. 2022 පැවති විදේශ ණය ප්‍රමාණය වූ ඇමෙරිකානු ඩොලර් බිලියන 83.6 2024 පළමු කාර්තුව වන විට ඩොලර් බිලියන 100 දක්වා වැඩිකර ඇත. දේශිය මෙන්ම ජාත්‍යන්තර ණය ලබා ගැනීම් වලදී ජනතාවගේ භාණ්ඩ හා සේවා මත පනවන බඳු ඉහළ දමමින් ද අර්ථ සාධක අරමුදලට බඳු පනවමින් ජල, විදුලිය, ඉන්දන මිළ වැඩි කරමින් ද ණය අර්බුදයට IMF යෝජනා ඒ ආකාරයෙන් ම ක්‍රියා කළ රජය මිනිසුන්ට සිටගෙන සිටීමටවත් බැරි ලෙස ණය බර බදු බර වල ප්‍රපාතයට ඇඳ දමා ඇත.

ලෝක බැංකුවෙන් අස්වැසුම ව්‍යාපෘතිය පවත්වා ගෙන යාමට මෙන්ම ගෑස් මිළ පවත්වාගෙන යාමට ඩොලර් මිලියන 570ක් 2024 පළමු කාර්තුව තුළ දී ගෙන ඇත. මෙසේ රට ණය අර්බුදයක ගිල්වා තිබියදීත් ප්‍රභූ පැලැන්තියේ සුබ විහරණය උදෙසා පරිපූරක ඇස්තමේන්තු මඟින් ඔවුන්ගේ වැය ශීර්ෂය වෙනුවෙන් මුදල් වෙන් කර ගැනීමට කටයුතු කිරීම කෙතරම් බලලෝභී ක්‍රියාවක් දැරූ සුඛෝපබෝගී වාහන සඳහා දළ විදේශ ගමන් සඳහා, ආරක්ෂක වියදම්, ඉන්ධන වියදම් සඳහා ද මේ මොහොතේ වැඩි කර ගැනීමට මාන බලන්නේ පුරවැසියාගේ මූලික අයිතීන් පවා අහිමි කරමිනි.

එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා එපරිද්දෙන්ම ඉටු කිරීම වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයට නව නීති හඳුන්වා දෙමින් පුරවැසියාගේ ස්වෛරීභාවය පාවා දෙමින් කටයුතු කිරීම තුළ රටේ අනාගතය කුණු කොල්ලයට විකිණීමට අවැසි මාවත් සකසා ගැනීමට සියළු කටයුතු නිර්ලජ්ජීව කර හමාරය.

රටක් වශයෙන් ගොඩ ඒමට නම් ජනතාවාදී පාලනයක් අවශ්‍යය. ජනතා පරමාධිපත්‍යයික අයිතිය සුරැකිරීමට, යුක්තිය සාධාරණත්වය ලබා දීමට කටයුතු කිරීම රජයේ වගකීම වේ. අලුත් ආර්ථික ජීවන දැක්මක්, නිශ්පාදන ක්‍රියාවලියක්, ජනතා දේශපාලන අභිලාෂයන් ඉටුවන මං පෙත් විවර වන අනාගතයක ආරංචි සුබ වන රටක් බිහි කිරීමේ හවුල්කරුවන් බවට පත් කර ගැනීමට පෙරමුණ ගමු.

1 පිටුවෙන්...

## රොෂේන් ශානක

තුවාල ලබා මිය ගිය අතර අනෙක් 7 දෙනා ජීවිත කාලය පුරාම ආබාධිත තත්ත්වයට පත් විය. රොෂේන් ශානක නිදහස් වෙළඳ කලාප සේවයට ගොස් ගතව තිබුණේ හාර මාසයක් පමණි. එදින වෙඩි තැබීමෙන් තුවාල ලබා රෝහල් ගත කළ ඔහු මිය ගියේ දෙදිනකට පසුව වූ අතර පසුව රජය තම විශ්‍රාම වැටුප් යෝජනාව හකුලා ගත්තේය.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා මහානාම තිලකරත්න කොමිෂන් සභාව එවකට පත් කරන ලද අතර එහි නිර්දේශ කිහිපයක් බලධාරීන් වෙත යොමු කරන ලදී. වසර දහතුනක් ගතවී ඇතත්, ශ්‍රී ලංකා රජය ද ඇතුළුව අදාළ සියලු පාර්ශ්වයන්ගෙන් කම්කරුවන්ට තවමත් යුක්තිය ලැබී නැත. රොෂේන් ශානක ඝාතනයට එරෙහිව පවරා ඇති නඩුව මීගමුව මහාධිකරණයේ විභාග වූ අතර මෙම නඩුවේ සාක්ෂි විභාගය අවසන් වී නඩුවේ තීන්දුව ලැබී ඇත.

2011 වසරේ පරාජයට පත් වූ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත වෙනත් ආකාරයකට යළි ඉදිරිපත් කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම තවමත් සියලු දෙනා මුහුණ දෙන අභියෝගයයි. මක්නිසාද යත් වත්මන් රජය ඒ පිළිබඳව අවස්ථා කිහිපයකදී දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හරහා අවස්ථා ලබා ගත් බැවිනි. නිදහස් වෙළඳ කලාපය තුළ සේවක සේවිකාවන්ගේ අසීමිත කැපවීම නිසා සේවක අර්ථසාධක අරමුදල වටා ඇති අරගලය එකල මල්ඵල ගැන්විණි. කෙසේ වෙතත්, දැනට සේවයේ නියුතු බොහෝ සේවකයින් සංගමයේ නිදහස සහ කේවල් කිරීමේ නිදහස යන අයිතිවාසිකම් සපුරාලීමෙන් කූටප්‍රාප්තියට පත් වූ අරගලය ගැන සැලකිල්ලක් නොදැක්වීම සේවා යෝජකයින් විසින් දැඩි කොන්දේසි දමා සේවකයින් බිය වැද්දීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි.

නිදහස් වෙළඳ කලාප තුළ සේවකයින් මුහුණ දෙන විවිධාකාර ගැටලු රාශියකි. එහි දී වෘත්තීය අයිතිවාසිකම් උල්ලංඝනයන්ට එරෙහිව කටයුතු කිරීමට වෘත්තීය සමිති පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ වැදගත්කම හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, කම්කරුවන්ට දඬුවම් පමුණුවනු ලබන අතර ඔවුන් වෘත්තීය සමිතිකරණයට සහභාගී වීමෙන් වලක්වාලීම සඳහා සේවා යෝජකයින් විසින් දැඩි කොන්දේසි වලට යටත් කර ඇත. රට තුළ සිටින සේවා යෝජකයින් සහ රජයන් යන දෙඅංශයෙන්ම සංගමයේ නිදහස ගැන සුළු හෝ සැලකිල්ලක් නොදක්වන අතර මෙම දෙපාර්ශවයම සපයන මෙම අයිතිය සුරැකීමට කිසිදු සහයෝගයක් ලබා නොදේ. විශේෂයෙන්ම මහ බැංකු දත්තවලට අනුව පසුගිය වසරට වඩා ඇඟළුම් අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අවස්ථාවක සේවක අයිතිවාසිකම් තහවුරු කිරීම සාධාරණ පදනමක් මත ඉදිරිපත් කිරීම අපගේ ක්‍රියාකාරීත්වයකි.

කම්කරුවන්ගේ මූලික අයිතීන් වෙනුවෙන් නොනවත්වා පෙනී සිටින මේ පසුබිම තුළ රොෂේන් ශානක සොහොයුරා ඇතුළු එම අරගලයේදී තුවාල ලැබූ සියලු දෙනා අනුස්මරණය කිරීමේ අවශ්‍යතාවය පවතී. 2011 වර්ෂයේ දිවි පුදා ලබා ගත් සංවිධානය වීමේ අයිතිය කම්කරු අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා අදටත් වලංගු බව කිව යුතුමය.

විදුමිණි වීරතුංග




# කාන්තා ශ්‍රමය තව තවත් සූරාකෑමට සලස්වන ආර්ථික පරිවර්තන පනත


ජනවරමක් නොමැති වත්මන් රජය 2024 මැයි 22 වැනි දින ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත සභාගත කරන ලදී. මෙම පනත් කෙටුම්පත 17 වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්ක ලිඛිතව නීතිගත කිරීම සහ මෙරට ආර්ථික ඒකාධිපතීත්වය ව්‍යුහාත්මකව ස්ථාපිත කිරීම අරමුණු කරයි.

**කාන්තා නායකත්වයෙන් යුත් වෘත්තීය සමිතියක් ලෙස කරුණු කිහිපයක් මත ඩාබිඳු සාමූහිකය සංගමය පනතට විරෝධය පළ කරන්නෙමු.**

- ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත මඟින් ආයෝජන කලාපයේ (Zones SL) නමින් නව ආයතනයක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති අතර එමඟින් අයෝජන කලාප කළමනාකරණය පුද්ගලික ආයෝජකයින්ට පැවරිය හැකිය. එනම් දැනට රාජ්‍ය මඟින් කළමනාකරණය කරන කලාප පෞද්ගලීකරණය කිරීමයි.
- අද වන විට වෙළඳ කලාප තුළ කම්කරු අයිතිවාසිකම් දුර්වල වී ඇත. මිනිස් බල (Manpower) සේවකයන් වැඩි වීම, සාමූහික කේවල් කිරීමේ බලය අඩුවීම, වෘත්තීය සමිති පිහිටුවීමට සහ ක්‍රියාකාරීව සම්බන්ධ වීමට ඇති නිදහස හීන වීම අපි නිරීක්ෂණය කරන්නෙමු. කලාප පුද්ගලීකරණය කර විදේශ ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන් ලිහිල් ශ්‍රම ක්‍රමය ඇති කිරීමෙන්, දැනටමත් දුර්වල කම්කරු අයිතීන් තව දුරටත් දුර්වල කරනු ඇත. මෙම පනත් කෙටුම්පත කාන්තාවන්ට අහිතකර බලපෑම් ඇති කරන (දැනට මෙම රජය සැලසුම් කරන) නම්‍යශීලී නොහොත් සූරාකන කම්කරු නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ පුරෝගාමියා වේ.
- යෝජිත ආයෝජන කලාප තුළ වෘත්තීය සමිතිවල අයිතිවාසිකම් පිළිබඳව මෙම පනත් කෙටුම්පතෙහි සඳහනක් නොමැත. මෙය කම්කරුවන්ට සංවිධානය වීමේ අයිතියට ඉඩ නොදීමකි. මෙය නිදහස් වෙළඳ කලාප සහ යෝජිත ආයෝජන කලාප ආශ්‍රිතව හා ඒ අවට රැකියා සහ ජීවන තත්වයන් සම්බන්ධයෙන් කම්කරු නියෝජනය ඉවත් කරයි.

8 වන පිටුවට...

# කළු ජූලියේ අඳුරු මතක



කළු ජූලිය ලංකා ඉතිහාසයේ සිදු වූ ඛේදනීය සිදුවීමකි. 1983 ජූලි 23 වන දින දායි. එම ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන්නේ දකුණේ ජීවත් වූ දමිළ ජනතාවයි. එම සිදුවීම නිසා ඔවුන් හට මුල් වරට මේ රට තුළ නිදහසේ ජීවත් විය හැකි යැයි තිබූ විශ්වාසය බිඳ වැටුණි. නිරපරාදේ දෙමළ වැසියන් මරා දමමින් ඔවුන්ගේ කඩ සාප්පු ගිණිබත් කරමින් ඒවා හි තිබූ බඩු භාණ්ඩ සොරා ගනිමින් මුළු කොළඹ නගරයම දුමෙන් වැසුණි. ඇඳිරි නීතිය දින ගණන් පනවා ජන ජීවිතය අඩාල කල අතර චිත්‍රාගාර, සිනමාශාලා ගිණිබත් කර ව්‍යාපාර ලෝකය විනාශ කිරීම, දෙමළ ජනතාව දකුණෙන් පළවා හැරීම කළු ජූලියේ දී සිදු වූ සත්‍ය සිදුවීමයි.

බොහෝ දමිළ ජනතාව රටින් බැහැර විය. මේ මේ ගැටුම ජාතිවාදයට මුල පුරා ඉන්පසු අපරාධකරුවන් නිදැල්ලේ හැසිරුණා. දෙමළ අය බව තහවුරු වී හිරිහැර කරයි යන බිය නිසා ඔවුන්ට නිදහසේ පාරේ ගමන් කිරීමට නොහැකි වුනා. දමිළ කාන්තාවන් තම නළලේ පොට්ටුවක් තබා යාමට බිය වුනා. විවිධ ජාතින් අප රට තුළ ජීවත් වන නිසා මෙම තත්ත්වයන්ට එකල පැවති රජය වගකිව යුතු වේ.

රට තුළ සිදුවුනු මේ අරාජික තත්වයන් තුල මහජනයා තමන්ගේ බලය ගෙන විරුද්ධවාදීන්ට එරෙහිව කල්ලි කණ්ඩායම් හදාගෙන මිනිස් ඝාතන සිදු කිරීමත් සමග යුද්ධය ඇති විය. තම දෙමව්පියන්, සහෝදරයන් මරා දමනවා දුටු බොහෝ දමිළ ජනතාව විදෙස් ගත විය. ඔවුන් නැවත ආපසු මෙරටට පැමිණීමට බියක් දැක්විය. මෙය අපෙන් වූ ලොකු වරදක් ලෙස පිළිගත යුතු අතර සුළු ජාතියගේ ස්වකීය අයිතීන් සුරක්ෂිත කිරීම රජයේ වගකීමකි. නමුත් එකල එවැනි දෙයක් සිදු නොවූ නිසාවෙන් දෙමළ ජනතාව තම අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත් වීමක් දක්නට නොලැබුණි. ඔවුන්ගේ ශක්තිය බෙලහීන තත්ත්වයකට පත් වී තිබූ නිසා ඔවුන් උත්සහ දැරුවේ ජීවිත රැක ගැනිමට හැකි පමණ සැඟව සිටීමයි.

ඉන්පසු ඇති වු කුරිරු යුද්ධය සමග මේ වන තෙක් විදෙස් ගත වු දෙමළ ජනතාව ලංකාවට ඒමට අකමැත්තෙන් සිටිති.

එවැනි කළු ජූලියක් හෝ කුරිරු යුද්ධයක් අප රට තුළ නොවේවායි අපි ප්‍රාර්ථනා කරමු.

එච්.අයි. සමන්මලී

# ජංගම වෛද්‍ය සායනය





වෙළඳ කලාප සේවිකාවන් වෙනුවෙන් මහජන මහජන සෞඛ්‍ය සේවා වැඩසටහනක් ලෙස එක් දින වෛද්‍ය සායනයක් ලෙස ජූනි මස 23 වන දින කිලිනොච්චි මලයාලපුරම් සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දි පැවැත් විණි. ඩාබිඳු සාමූහිකයේ පූර්ණ අනුග්‍රහය යටතේ, කිලිනොච්චියේ කරච්චි මහජන සෞඛ්‍ය නිළධාරී කාර්යාලය විසින් දියත් කළ මෙම වෛද්‍ය සායනය සඳහා සියයකට ආසන්න කම්කරු පිරිසක් සහභාගි විය.

ඔවුන් සඳහා වෛද්‍ය උපදෙස්, ප්‍රතිකාර සහ ආහාර පාන සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දුන් අතර අවශ්‍ය වැඩි දුර උපදෙස් සඳහා ද ක්ෂණික යොමු කිරීම් සිදු කෙරුණි. වෛද්‍ය සායනය තුළ කාන්තා සේවිකාවන්ට විවිධ ආකාරයේ පරීක්ෂණ සඳහා පහසුකම් සලසා තිබුණි. ශාරීරික පරීක්ෂණ සහ රුධිර පීඩනය මැනීම, දියවැඩියාව සඳහා රුධිර සීනි පරික්ෂාව, සායනික පියයුරු පරීක්ෂණ සහ පැප් පරික්ෂණය සිදු කරනු ලැබීය.

එසේම ඩාබිඳු විසින් සිදු කරනු ලබන පර්යේෂණයක් සඳහා ඉලක්ක ගත කණ්ඩායම් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූ අතර පවුල් සැලසුම් ප්‍රතිසංවිරෝධක පිළිබඳ උපදේශන සැපයිම, ඔසප් චක්‍රයේ ගැටළු සඳහා උපදේශන සැපයීම සහ ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත සෞඛ්‍ය අධ්‍යාපන දැනුම බෙදා දීම ද සිදු කරන ලදී.



# ක්‍රියාකාරී කමිටු රැස්වීම

කර්මාන්තශාලා වල වර්තමාන තත්ත්වය පිළිබදව සාකච්ඡා කිරීමට සහ නව පනත් පිළිබදව ප්‍රජාව දැනුවත් කිරීමටත් බියගම ඩාබිඳු කාර්යාලයේ දී කමිටු රැස්විම සිදු කරනු ලැබිණි. මීට අමතරව වාර්ෂිකව පවත්වනු ලබන දන්සල පැවැත් වීම සඳහා සංවිධාන කටයුතු සුදානම් කිරිම සහ සිදු කිරිමට නියමිත ව්‍යාපෘති පිළිබඳවත් කමිටු රැස්වීමට පැමිණි පිරිස දැනුවත් කරන ලදී.



# කිලිනොච්චි නව කාර්යාල විවෘත කිරීම



කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ඩාබිඳු සාමූහිකයේ නව ශාඛාවක් 2024 ජූනි 22 වන දින කිලිනොච්චියේ දී විවෘත කරන ලදී. තව දුරටත් ඩාබිඳු සාමූහිකයේ සේවාවන්හි දිගුවක් ලෙස උතුරේ කම්කරු සේවක අයිතීන් සුරක්ෂිත කිරීමේ සහ සිවිල් සමාජ සංවිධාන පාර්ශවකරුවන් සමඟ සබඳතා ජාල ගොඩ නගා ගැනීමේ අරමුණින් මෙය පිහිටුවන ලදි. මෙම උත්සවය සඳහා කිලිනොච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා කටයුතු සංවර්ධන නිළධාරීන්, ග්‍රාම සේවා නිළධාරින්, සමාජ ක්‍රියාකාරීන් සහ කිලිනොච්චි මහජන සෞඛ්‍ය සේවා නිළධාරී කාර්යාලයේ නිළධාරීන් ද කම්කරු ප්‍රජාවගේ ද ඩාබිඳු සාමූහිකයේ නිළධාරී මඩුල්ලගේ ද සහභාගිත්වයෙන් පරවිපන්ජාන් කුලවීදී, කිලිනොච්චි හි දී සිදු කරන ලදී.

එහි දී වසර හතළිහක් පුරාවට ඩාබිඳු සිදු කළ සේවාවන් පිළිබඳවත් 2016 සිට මේ වන තුරු කිළිනොච්චි ප්‍රදේශය තුල සිදු කල සේවාවන් සහ ඉදිරියට සිදු කිරීමට නියමිත වැඩසටහන් සම්බන්ධව පැමිණි පිරිස දැනුවත් කළ අතර එම අවස්ථාව සමඟ එක් වූ ග්‍රාම සේවක නිළධාරීන් විසින් කම්කරු පිරිස මුහුණපාන ගැටළු සහ අර්බුධකාරී වාතාවරණයන් ගැන එහි දී තොරතුරු දක්වන ලදී.

# පොදු කුස්සිය සංකල්පය අඛණ්ඩව



රට තුළ පවත්නා අර්බුදකාරි ආර්ථික ක්‍රමය හමුවේ පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම බොහෝ දෙනෙකුට ඉතාමත් අසීරු කාර්යයක් වී ඇති බව ආන්තික ප්‍රජාවන් සමඟ කටයුතු කිරිමේ දී අප හට හොඳින් වැටහේ. ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සඳහා කර්මාන්තශාලා හරහා ලබා දෙන ආහාර වේල පෝෂණයෙන් හෝ ගුණාත්මක අන්දමින් සකස් නොවේ. මෙසේ අඩු පෝෂණ තත්වයක් යටතේ රැකියාවේ නිරත කාන්තාවන් සඳහා සවියක් විමේ අරමුණින් ඩාබිඳු පොදු කුස්සිය සුබසාධන වැඩසටහන මෙවර ජූනි 09 වන දින කටුනායක ආයතන පරිශ්‍රයේ දී ඉතාමත් සාර්ථකව සිදු කෙරුණි. ඒ හරහා සේවකයන් සියයකට වැඩි පිරිසකට දිවා ආහාර වේල ලබා දිමට හැකි විය.

# බියගම කම්කරුවන් වෙනුවෙන් පාන් දන්සල

මෙවර ඩාබිඳු සාමූහිකය විසින් වෙසක් පොහොය නිමිති කර ගනිමින් කණ්ඩායම් සාමූහිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් පාන් සමඟ සීනි සම්බෝල දන්සලක් බියගම ආයතන පරිශ්‍රයේ දී සංවිධානය කෙරිණි. මෙහිදී කම්කරු ප්‍රජාවගේ සහභාගීත්වයෙන් දන්සලේ සියලු කටයුතු සූදානම් කළ අතර එදින පුරාවට පැවති අයහපත් කාලගුණ තත්වය නිසාවෙන් ඩාබිඳු කාර්යාලයට ආසන්න පේරගස් හන්දිය ඇතුළු ප්‍රදේශ කීපයක්ම ජලයෙන් යට වූ අතර එහි දී නේවාසිකාගාර කීපයක්ම ජලයෙන් යට විය. කෙසේ වෙතත් අවතැන් වූ ප්‍රජාව ඇතුළු ප්‍රදේශවාසීන් දහසකට අධික පිරිසක් දන්සල භුක්ති විඳින්නට විය. අධික වර්ෂාව හේතුවෙන් දැඩි අපහසුතාවයන් මධ්‍යයේ වුව ද දෙවන වරටත් ඉතාමත් සාර්ථක අන්දමින් දන්සල සිදු කෙරිණි.



# මලයගම් අභිමානී පා ගමන




බ්‍රිතාන්‍ය පාලන සමයේ ලාංකීය තේ වතුවල සේවයට වසර 201 කට පෙර මෙරටට පැමිණි දකුණු ඉන්දිය මලයගම් ප්‍රජාව ප්‍රථම වරට අභිමානී පා ගමන නුවරඑළියේ දී සමරන ලදී. ජූනි 8 දින නුවරඑළියේ අරුවි පදනම විසින් සංවිධානය කර පැවැත් වූ පා ගමනේ තේමාව වුයේ මලයගම් ප්‍රජාව අතර සිටින LGBTQIA+ ප්‍රජාව සඳහා සමාජය තුළ පිළි ගැනීම, සමානාත්මතාවය සහ දෘශ්‍යතාව ප්‍රවර්ධනය කිරීමයි.

නුවරඑළිය තැපැල් කාර්යාලය අසලින් ආරම්භ වූ පා ගමන නගරය පුරා පිහිටි වීදි ඔස්සේ අභිමානවත් පෙළපාලියකින් ගමන් ගත් අතර මලයගම් ප්‍රජාවට ආවේණික වු සංස්කෘතික අංග රැසකින් සහ ඔවුන්ගේ සුවිශේෂී දක්ෂතාවයන්ගෙන් පූර්ණ වු අංග ගණනාවකින්ම පා ගමන විචිත්‍රවත් වූ අතර සියයකට ආසන්න පිරිසක් ඒ සඳහා සහභාගී විය.



3 පිටුවෙන්... **කාන්තා ශ්‍රමය තව තවත්**

- වර්තමානයේ කම්කරු දෙපාර්තමේන්තුවට කම්කරු ආරවුල් සඳහා මැදිහත් වීමට බලය ඇත. කම්කරු විනිශ්චය සභා පැවැත්වීමට බලය ඇත. නමුත් මෙම පනත් කෙටුම්පතේ 88 යන වගන්තිය යටතේ, ශ්‍රී ලංකා අයෝජන කලාප තුළ කම්කරු ආරවුල් විසඳීම සඳහා විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණ නිර්දේශ කිරීමට ආර්ථික කොමිෂන් සභාවට හැකි වේ. බේරුම්කරණය (Arbitration) වැනි විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණ, අඩු වැටුප් මත ජීවත් වන කම්කරුවන්ට මිල අධික වන අතර එම නිසා සමාගම් සහ වෙළඳ නාම සඳහා වාසිසහගත වනු ඇත. මෙය රාජ්‍ය අධිකරණ පද්ධතීන් (කම්කරු විනිශ්චය සභා වැනි) පුද්ගලීකරණය කිරීමකි. එමඟින් කම්කරුවන්ට ඇති සාමූහික කේවල් කිරීමේ බලය ශූන්‍ය කරයි.
- කලාප නිර්මාණය කිරීමේ ගැටලුව නම්, එය විශේෂ නීතියක් යටතේ පාලනය වන එමඟින් රටේ පොදු නීතියෙන් නිදහස් වන, රටක් තුළ රටක් නිර්මාණය කිරීමයි. එමඟින් ක්‍රියාකාරීත්වය වන්නේ මෙරට ස්ථාපිත කම්කරු, ඉඩම් සහ පාරිසරික නීති ආරක්ෂා කරන සුරක්ෂිත රැකියා සහ ජීවනෝපායන් ඉල්ලා සිටීමයි. විදේශීය ආයෝජකයින් ගෙන්වා ගැනීම සඳහා පමණක් කම්කරුවන් ආරක්ෂා කරන නීති අත්තනෝමතික ලෙස නොසලකා හරින රැකියා අපි ප්‍රතික්ෂේප කරන්නෙමු. විදේශ විනිමය මෙරටට ගෙන ඒමේ ප්‍රමුඛතාවයෙන් අපගේ කම්කරු කාන්තාවන් සූරාකන රැකියා අපි ප්‍රතික්ෂේප කරන්නෙමු.
- ජා.මූ.අා. නියම කර ඇති බොහෝ සාර්ව ආර්ථික ඉලක්ක මෙම පනත් කෙටුම්පතට ඇතුළත් වන අතර, එයින් එකක් වනුයේ 2030 වන විට 40% කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වයක් ඇති කිරීමයි. මෙවැනි ඉලක්ක හරහා මෙම ආර්ථික ආධිපත්‍යය කාන්තා සුරැකුම් වැඩ සහ ශ්‍රමය සම්පූර්ණයෙන්ම නොසලකා හරිමින් කාන්තා ශ්‍රමය සූරාකෑමට දිගින් දිගටම පවත්වා ගෙන යාමට ඉඩ සලසයි. රාජ්‍ය දිවා සුරැකුම් පහසුකම් සහ සුරැකුම් ශ්‍රමය සඳහා ආධාරක ව්‍යුහයන් නොමැති රැකියා පරිසරයක් කම්කරු කාන්තාවන්ට අසාධාරණ ශ්‍රම ව්‍යුහයක් වේ. එමෙන්ම, ශ්‍රම-දැඩි ක්‍රම හරහා කාන්තාවන් ඔවුන්ගේ සුරැකුම් වැඩ කිරීමට තල්ලු කර ඇති, ඔවුන්ගේ සුරැකුම් ශ්‍රමයට පීඩනය වැඩි කරන, රජයේ සහ ජා.මූ.අා. කප්පාදු වැඩසටහන නොසලකා හරිමින් කාන්තාවන්ගේ ශ්‍රම බලකායේ සහභාගීත්වය ගැන කතා කළ නොහැක. ශ්‍රම සූරාකෑමේ දිගටම පවතින මෙම යල් පැන ගිය සාර්ව ආර්ථික දර්ශක තුළ සුරැකුම් වැඩ අගය කළ යුතු වේ.
- රජයේ සහ ජා.මූ.අා. කප්පාදු වැඩසටහන මගින් උග්‍ර කරන ලද පවතින ආර්ථික අර්බුදයකදී ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියළු පුරවැසියන් විසින්, තම තමන්ට සහ තම පවුලේ සාමජිකයන්ට සාක්ෂාත් කර ගැනීමේ වගකීම, වගකීම, පුරවැසියාටම තල්ලු කිරීම මෙම පනත් කෙටුම්පත අරමුණු කරයි. බදු වැඩි කරමින්, EPF/ETF කප්පාදු කරමින්, විදුලිය, ජලය, ගෑස් මිල වැඩි කරමින්, ගෝලීය ධනකුවේරයන්ගේ ණය ගෙවීමේ වගකීම මෙරට වැඩකරන ජනතාව ණය උගුල් වලට තල්ලු කරන අසාධාරණයකි. එවන් ණය උගුල්වලට තල්ලු කර වැඩකරන ජනතාවගේ සහ ආන්තික වූ ජනතාවගේ සෞඛ්‍ය, ආහාර, අධ්‍යාපනය සහ අනාගතය පිළිබඳ වගකීමෙන් මිදීමට මෙම ආර්ථික ආධිපතීත්වය සලස්වයි.

**මේ රටේ ආර්ථික පාලනයේ ව්‍යුහාත්මක වෙනස්කම් කිරීමටත්, ආණ්ඩුවේ විධායක බලය වටා බලය තීව්‍ර කිරීමටත් ජනවරමක් නොමැති මෙම රජයට ව්‍යවස්ථාපිතව අයිතියක් නැත. එම නිසා මෙම ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන්නෙමු.**



# දකුණු ආසියාතික ලිංගික ශ්‍රමිකයන්ගේ සමුළුව




සැමට ගෞරවයෙන් හා සමානාත්මතාවයෙන් ජීවත් විමට වඩාත් සාධාරණ සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීමේ අරමුණින් දශක දෙකකට වඩා වැඩි කාලයක් මුළුල්ලේ කටයුතු කරන ගෝලීය දකුණ පදනම් වූ සහ ගෝලිය දකුණේ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ස්ත්‍රීවාදී ජාත්‍යන්තර මානව සංවිධානයක් වන CREA සංවිධානය මඟින් ප්‍රථම වරට දකුණු ආසියානු ලිංගික ශ්‍රමිකයන්ගේ සමුළුව 2024 මැයි මස 29, 30, 31 යන තෙදින පුරාවට නේපාලයේ කත්මන්ඩු නුවර දී පවත්වන ලදී. ලිංගික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා බංගලාදේශය, ඉන්දියාව, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල නියෝජනය කරමින් ලිංගික ශ්‍රමිකයන් සහ මිත්‍ර පාර්ශවකරුවන් ඇතුළු දෙසියයකට අධික පිරිසක් මේ අවස්ථාව සඳහා සම්බන්ධ විය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඩාබිඳු සාමූහිකයද ඊට සහභාගී විය. අවිධිමත් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන්ගේ අයිතින් සම්බන්ධව සාකච්ඡා කිරීමට පැවති අවිධිමත් විද්වත් මණ්ඩල සාකච්ඡාවේ විද්වත් මඩුල්ල සඳහා ද ඩාබිඳු සාමූහිකය සහභාගී විය. එහිදී පැමිණ සිටි පිරිස් සිය ජීවිතයේ ලද අත්දැකීම් බෙදා ගැනීම, විද්වත් මණ්ඩල සාකච්ඡා පැවැත් වීම, සහ සහයෝගිතාව ගොඩ නැගීම සඳහා ද විවිධ ක්‍රියාකාරකම් සිදු කෙරුණු අතර බොහෝ පිරිස් ශ්‍රම සූරා කෑම තුළ අඩු වැටුප් ලැබීම නිසාවෙන් ඉතා ඉක්මනින් ලිංගිකත්වය ශ්‍රමයට විකිණීමේ දැඩි පෙළඹවීමක් ඇති බව දක්නට ඇති බව එහි දි සිදු වු කතිකාවත් තුළ දි පැහැදිලි වේ. සමුළුව අවසානයේ රජයන්, බහු පාර්ෂවික ආයතනයන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, සිවිල් සමාජ සංවිධානයන්, සහ නීති සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සිය ඉල්ලීම් ඉල්ලා සිටිමින් ලිංගික ශ්‍රමිකයින් සහ මිත්‍ර පාර්ශවකරුවන් කත්මන්ඩු ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

# නැගිටිමු අපි එකා වගේ

මොර ගානවා යකඩ කටක්
පැක්ටරියේ උඩුමහලෙන්
වැඩට දිව්වේ පාන්දරින්
ගෙදර ආවේ හඳ පානෙන්
තෙත බරියන් කොන්ඩේ මගේ
දුගඳ හමයි නිතර එයින්
වේලෙන්නට නැත, ටයිමින්,
වැඩ කෙරුවා, ඩා, හෙලමින්
රුපියලකට සීමා කළ
මාගේ ඩා බිඳුව මෙන්න
ඒවගේ මුතු නෙලාගන්නේ
අරාබියේ තෙල් පප්පල
අක්කේ නංගියේ තවමත්
බලන් ඉන්නේ ඇයිද ඉතින්
ඩා බිඳු අපේ සූරාලා
ලේ බිඳු ටික උරා බීලා
උපයාගෙන යාවි
හපටික මෙහි ගොඩ ගහලා
නැගිටිමු අපි එකා වගේ
සත පනහක් වැඩි කරන්න
නැති නම් උන් විනාශකර
නිජ භූමිය රැකල දෙන්න

සේවිකාවක්



# සිතුවිල්ල

වෙසක් මස ගෙවී ගොස් ඇත. පොසොන් මස උදා විය. වෙසක් මාසයේ සේම පොසොන් මාසයේද  දන්සල් වල අඩුවක් නොවීය. බඩ කට පිරෙන්න කෑම කෑවා අනේ හැමදාම මෙහෙම කෑම ලැබෙනවානම් ලැබෙන සම්තින් එක ඉතුරු කරගන්න පහසු වෙනවා.


අපේ කට්ටියත් රට යන්න පටන් අරන් බෝඩිම පාලුවෙලා. වෙළඳුන්ටත් ආදායම් බැහැලා. අනේ මන්දා ඇඟළුම් ගැලවිලාම යයිද එහෙම ගියොත් අපට හුප්පෙ තමයි. "කාමර කුලියට දීමට ඇත" බෝඩ් ලෑලි කලාපය අවට දක්නට ඇත. සමහර අය අර්ථ සාධකය ගන්න පොර කති. හැබැයි ඒක තිබුණායි කියල එතරම් වැඩකුත් නැහැ. ඒකටත් බදු ගහලා අපට කවද්ද සාධාරණයක් යුක්තියක් ඉටු වුනේ. ගමේ දී කාපු කොස්, දෙල්, අල, බතල වල හයිය නිසා වැඩපලේ ගේම දෙනවා නැත්නම් මේ තුළ නහින නැහිල්ලට ශරීරය ඉතුරු වෙයි ද?

අපිත් අනාගතයේ මුහුණ දෙන්න ඉන්න මව්වරුන් නමුත් මන්ද පෝෂණයෙන් පිරිලා. මුළු ගතම ලෙඩ වෙලා ඇවිද ගන්න බෑ කකුල් දෙක වයලීන් ගහනවා. උප්පැන්න සහතිකයට දාපු නම නෙමෙයි කලාපය තුල වැඩ කරන විට කිය වෙන්නෙ. අන්වර්ථ නාම අපමණයි. ඔය රස්සාව කර ගෙන ඉන්න ලැබෙන්න නැහැ. බැන්දහම ඒක කර ගන්නත් ෆුල් ට්‍රයි එකක් දෙන්න එපායැ. අපේ සුදුසුකම උසස් පෙළේ සබ්ජට් කරලා වගේ රූමත්, ධනවත් , නැණවත්, කුලවත්,බොදු ගොවි, කලින් විවාහ වෙලා තියනවාද? වයස කීයද? උසස් පෙළ පාස් ද? සමහරු ඉන්නවා වරදට සමාව දෙන අය අහගෙන එනවා එයාලා හරියට කිසිම දෙයක් නොකල අය තොත්ත බබ්බු වගෙයි. අපේ දේවල් හොයන්න එන්නෙ එයාලා හොඳ පොරවල් වගේ. ඉස්සර නම් කලාපයෙන් පිට වැඩ කරන අයත් සොයලා තියෙනවා විවාහ වෙන්න අනේ කාලේ වනේ වාසේ කිවලු.

අපිට කොයින්ද හැන්ඩ්සම් බෝයිලා අපිට බැල්ම හෙලන්නෙ අප විසින් නඩත්තු කළ යුතු අය තමයි. නැත්නම් අපේ කනකර, පඩි පැකට්ටු, අපිට මව් පදවිය ලබා දී පැනලා යන උපත සිදු කරලා විපත සිදු කරගන්න අපට පවරලා යන මගෝඩිස්ලා තමයි, අපේ කෙල්ලන්ට බොහෝ විට හමු වෙන්නෙ. මේවට වගකිව යුත්තා කවුරුන්ද?

සමන්තා

# ප්‍රහේලිකා අංක - 47



## හරහට

1. නැව් ගමනට පහසුව සපයයි.
2. මේවා දෙනවනම් වැඩ කරන්න හිත ගෙන දෙයි.
3. විනෝදකාමී අවස්ථාවකි.
4. සාමයේ සංකේතය
5. මුහුදේ යන යාත්‍රාවකි.
12. ප්‍රශ්න දුර දිග යාමෙන් ඇති වේ.
14. ගොවිතැන් කරන කන්නකි.

## පහළට

1. සැවොම ලැබීමට කැමති.
11. බනිජ සම්පතකි.
6. ලෝක කාන්තා දින සැමරුම යෙදී ඇත්තේ මේ මාසයටයි.
7. සිහින යන්නට සමාන පදයකි.
8 තරු රටාවකි.
9. අමාරු යන අදහස ඇති.
10. මේ නිසා වැඩිහිටි ලෙස හඳුන්වයි.
13. කකුල මේ නමින් හඳුන්වයි.

මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා
මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.
ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.

# ඩාබිඳු සාමූහික සංගමය




ඩාබිඳු සාමූහික සංගමය 2021 මැයි මස 12 වන දින කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වෘත්තීය සමිතියක් ලෙස ලියාපදිංචි විය. එය පසුගිය කාලය තුළ පියවරෙන් පියවර ඉදිරියට පැමිණි කාන්තාවන් සඳහා සුවිශේෂී වූ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට ම පොදු වූ වෘත්තිය සමිතියකි. කාන්තාවන් සඳහා සුවිශේෂී වූ වෘත්තීය සමිතියක් ලෙස අප 2024 වර්ෂයේ අභිමානවත් තෙවන වසර සමරනු ලබයි. ගෙවුණු තෙවසර ඇතුළත අපගේ ක්‍රියාකාරීත්වය.

- කම්කරු නීතිය සහ වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුවත් කිරීම්.
- කම්කරු හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම හා සම්බන්ධ දැනුවත් කිරීම්
- නිදහස් වෙළඳ කලාප සඳහා අනන්‍ය වූ නව නීති සංශෝධන (දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය, නව කම්කරු නීති ප්‍රතිසංස්කරණය, බදු පනත, ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත යනාදිය) සඳහා මැදිහත්වීම්
- කම්කරු අයිතිවාසිකම් උල්ලංඝනයවීම් වලට එරෙහිව නීති ආධාර සැපයීම (අත්තනෝමතික ලෙස කර්මාන්තශාලා වසා දැමීම හේතුවෙන් රැකියා අහිමි වන සේවක ප්‍රජාව වෙනුවෙන්, සේවය අවසන් කිරීමේ අවස්ථාවන්හි වැටුප් ගණනය කිරීමේදී සිදුවන අත්තනෝමතික ක්‍රියා වලට එරෙහිව සේවක ප්‍රජාව වෙනුවෙන්, කර්මාන්තශාලාවල ආහාර විෂ වීම වැනි වෘත්තීය සෞඛ්‍ය ගැටලු වලදී වින්දිත සේවක ප්‍රජාව වෙනුවෙන්, කර්මාන්තශාලාව තුළ දී මෙන්ම ඉන් පිටත දී සිදුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩත්වය හා සම්බන්ධ ගැටලු වලදී වින්දිත සේවක ප්‍රජාව වෙනුවෙන්, ලිංගික සුළුතර ප්‍රජාවට එරෙහිව පැන නගින ගැටලු වලදී වින්දිත සේවක ප්‍රජාව වෙනුවෙන්)
- මානසික හා සමාජීය ගැටලු සඳහා උපදේශන වැඩසටහන් පැවැත්වීම (පවුල්, කණ්ඩායම් සහ තනි පුද්ගල)
- නිදහස් වෙළඳ කලාපයේ පෝෂණය ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම
- ජංගම වෛද්‍ය සායන පැවැත්වීම් යන අංශ ඔස්සේ සිදු කිරීම විශේෂ වේ. ඉහත සියලු සේවාවන් ඩාබිඳු සාමූහික සංගමයේ සමාජිකයෙකු ලෙස අප හා අත්වැල් බැඳ ගැනීම මඟින් නිදහස් කලාප වල මෙන්ම ඉන් පිටත ශ්‍රී ලංකාව තුළ සේවයේ නියතු ඔබට ලබා ගත හැකියි.

**අප හා සම්බන්ධ වීමට පහත ක්‍රමවේදයන් හරහා හැකියාව පවතී.**

ඩාබිඳු සාමූහික සංගමය,
අංක 221, වෙළබඩ පාර, කටුනායක.
දුරකථන අංකයː 0114 851 383
FB: Dabindu Collective Union – Sri Lanka
Email: dabinducollectiveunion@gmail.com
Instagram: Dabindu Collective Union – Sri Lanka
Web: WWW.dabinducollective.org





# කම්කරු නායකයින්ගේ මීළඟ පරම්පරාව - කිලිනොච්චිය සහ වවුනියාව

2024 ජූනි 30 වැනි දින පවත්වන ලද සේවක නායකයින් සඳහා නායකත්ව පුහුණු වීමේ දෙවන අදියරය වවුනියාවේදී පැවැත්විණි.

**කිලිනොච්චියේ සහ වවුනියාවේ කම්හල්වල කම්කරුවන්ගේ යථාර්ථය:**

- කම්කරුවන් පවසන පරිදි කිලිනොච්චියේ සේවක අයිතීන් උල්ලංඝනය කිරීම් දරුණු වෙමින් පවතී.
- අගෝස්තු මාසය දක්වා කම්කරුවන්ට පැය 12ක වැඩ මුර ඔවුන්ට පවරා ඇති තරමට කම්කරුවන් සඳහා ඉලක්ක වැඩි වී ඇත. සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමේ සහ හිමිකම් විෂමතා කිහිපයක් මතු කළහ. සමහර සේවකයන්ගේ 2019 සහ 2020 අවුරුදුවල මාස කිපයක EPF ප්‍රතිලාභ තැන්පත් කර නැති බව වාර්තා කළහ. මෙය EPF නීති උල්ලංඝනය කිරීමකි.
- වැඩ කරන පැය ගණන වැඩි වීම සහ එම නිසා නිවාඩු දින නොමැතිකම හේතුවෙන් කම්කරුවන් ප්‍රකාශ කළේ තම ප්‍රජාව සහ වෘත්තීය සමිති සමඟ සම්බන්ධ වීමට කාලය නොමැති බවයි. කම්කරුවන්ට තමන් සහ පවුල සඳහා කාලය නොමැතිකම, විවේක දින නොමැතිකම සේවකයින්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට බලපායි.
- කර්මාන්තශාලා කළමනාකාරීත්වය අඛණ්ඩව කම්කරුවන් නිරීක්ෂණය කරන අතර වෘත්තීය සමිති වැඩසටහන්/රැස්වීම්වලට සම්බන්ධ වන සේවකයන් සටහන් කරයි. එබැවින් වෘත්තීය සමිති හෝ වෙනත් සාමූහික ක්‍රියාකාරකමකට සම්බන්ධ වීමෙන් කම්කරුවන් රැකියා අහිමි වේ යැයි බියෙන් පසුවෙති.
- පිරිසිදු පානීය ජලය නොමැතිකම, තම සේවා ස්ථාන ආසන්නයේ පානීය ජලය නොමැතිකම සහ ආහාරයට ගත නොහැකි සහ නිසි ලෙස පිසූ ආහාර නොමැති බවට කම්කරුවන් පැමිණිලි කළහ.
- අධික නිෂ්පාදන ඉලක්ක හේතුවෙන් කම්කරුවන් අධික කාලයක තුළ එක්තැන් කර ඇත. නැටුම් ආකෘති (Dancing model)හි වැඩ කරන කම්කරුවන් පැය ගණනක් සිටගෙන සිටිය යුතු අතර එක් සේවකයෙකු මේ නිසා වෙරිකෝස් නහර ඇති විය.
- උතුරේ බොහෝ ප්‍රවාහන සේවා සෘජුවම කම්කරුවන්ගේ නිවෙස් වෙත ප්‍රවාහනය නතර කර ඇති අතර, කම්කරුවන් ඔවුන්ගේ නිවෙස්වලට කිලෝමීටර් 6-7 ක් දුරින් පිහිටි ප්‍රධාන මාර්ගයේ සිට පයින් ගමන් කරනු ඇත. රාත්‍රී කාලයේ සේවකයන් මෙය "ජීවිත තර්ජනයක්" ලෙස වාර්තා කළේය.

**නායකත්ව පුහුණු වීමේ දෙවන අදියරය කම්කරුවෝ තම වැඩපොළේ ගැටලු මතු කළ අතර එකට එක්ව ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් නිර්මාණය කළහ.**

අංකඃ 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.